කෘෂිකර්මය - පෙරළෙන ලෝකයක අපේ බල පවුර

1. පිළි පැන්න සංවර්ධන - ආර්ථික චින්තාව
2. හාල් මිල සමීකරණය
3. එක යායක් - එක කළමනාකරණයක්
4. ගොවි සමාගමේ යුග මෙහෙවර
5. ග්‍රාමීය ණයගැති භාවය
6. ගොවි ව්‍යාපාරික ප්‍රජාව

ඇමුණුම 1 : ගොවි සමාගම් පනතක සඳහන් විය යුතු ප්‍රතිපාදන

ඇමුණුම 2 : ගොවි සාමූහිකය සඳහා කෙටුම්පත් ගිවිසුම / ව්‍යවස්ථා මාලාව

ආර්. ඒ. ජයවීර

අර්ථ ගවේෂකයෝ ප්‍රකාශනයකි

(**'අර්ථ ගවේෂකයෝ' යනු වරලත් ගණකාධිකාරී පී.ඊ.** මැතිව් සහ සමාගමේ සමාජ වගකීම් අංශයයි.)

'යථින්දඛීලෝ පඨවිංසිතො සියා - චතුබ්භි වාතේභි අසම්ප කම්පියෝ' - යම් සේ පොළොවෙහි පිහිටා සිටි ඉන්ද්‍රකීලය, සිවු දිගින් හමන මාරුතයෙන් සෙලවිය හැකි නොවේ ද, එලෙස ම අර්ථලාභී සමාජ - ව්‍යවසාය පදනමක පිහිටවනු ලබන කෘෂිකර්මය, ඉන්ද්‍රකීලයක් ලෙස නොසැලී සිටිමින් ජාතික ආර්ථිකය ආරක්ෂා කරයි, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරමින් සාගත බියෙන් හා රෝග බියෙන් රට ගලවා ගනී, ගොවීන්ගේ ආදායම ඉහළ නංවමින් ම පාරිභෝගිකයාට හොඳ මිලක් ලබා දෙයි, ණය ගැති භාවයේ වියගසින් ග්‍රාමීය ජනයා මුදවා ගනී, කෘෂි-පාදක කර්මාන්තවලට මුල පුරයි, නව තාක්ෂණයට තෝතැන්නක් වෙයි, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආර්ථිකයක පවුරු පදනම් ශක්තිමත් කරයි, ආර්ථික විශේෂඥයන්ගේ 3-5% න්‍යායික සීමා කඩා බිඳ දමමින් වාර්ෂික වර්ධන වේගය සිතා ගත නොහැකි තරමට ඉහළ නංවයි. ඒ සඳහා, පීලි පැන තිබෙන සංවර්ධන-ආර්ථික චින්තාව නිසි තැන පිහිටුවීම, "එක යායක් - එක කළමනාකරණයක්" යන සංවිධාන ආකෘතිය හා ගොවි සමාගම් පදනම කරගත් නව කෘෂිකාර්මික ආර්ථික බලයක් ස්ථාපිත කිරීම හා ණය ගැති භාවයේ වියගසින් ග්‍රාමීය ජනයා මුදවා ගැනීම අවශ්‍ය වේ.

ආර්ථික මිසයිලයක් සේ පෙනෙන, ට්‍රම්ප්ගේ තීරු බදු නැංවීමට ඇමෙරිකානු පන්නයේ ම පිළිතුරක් වෙමින්, අපේ ආර්ථික පදනම ශක්තිමත් කරගත යුතු ය. නොඑසේ ව, පෙත්සම් ඔප්පු කිරීමෙන් හෝ දුක් ගැනවිලි කියා හඬා වැලපීමෙන් හෝ ගෝලීය මාරුතයන්ට මුහුණ දීමට හැකි වන්නේ නැත.

1. පීලි පැන්න සංවර්ධන - ආර්ථික චින්තාව

දියුණු රටවල ආර්ථික ඉතිහාසය හැදෑරීමේදී අපට පෙනීයන්නේ කෘෂිකාර්මික ඵලදායකත්වය ඉහළ ගොස් ඇති බව හා එමඟින් ඇති වූ අතිරික්තය එම රටවල කාර්මිකකරණයට හා සංවර්ධනයට සැලකිය යුතු බලපෑමක් කර තිබෙන බව යි. මෙම බලපෑම කරනු ලැබ ඇත්තේ එම රටවල කාර්මික භාණ්ඩ සඳහා දේශීය වෙළඳපොළ පුළුල් කිරීමත්, කර්මාන්ත සඳහා ශ්‍රම බලකාය නිදහස් කිරීමත්, ප්‍රාග්ධන සම්පාදනයත් මඟිනි. අනෙක් අතට කෘෂිකර්මාන්තයේ ඵලදායකත්වය නැංවීමට කාර්මිකකරණයේ දායකත්වය ලැබිණි. එම රටවල ආර්ථික සංවර්ධනය නැඟී සිටියේ කෘෂිකර්මය හා කර්මාන්ත නමැති දෙපයිනි.

මෙරට නම් කිසි කලෙක කාර්මිකකරණය හා සංවර්ධනය සඳහා එවැනි තල්ලුවක් කෘෂිකර්මයෙන් ලබා ගත හැකි වී නැත. අපේ සාම්ප්‍රදායික ආහාර බෝග කෘෂිකර්මය තවමත් පවතින්නේ කිහිලිකරු ආධාරයෙනි, පසුගාමීව ය. උපරිම වශයෙන් වුවද යැපුම් මට්ටමට විනා ඉන් ඔබ්බට යාමට නොහැකි වූ දුබල කෘෂිකර්මයට ගැමි දුප්පතුන්ගේ අතමිට සරු කළ හැකි නොවීය. ග්‍රාමීය රැකියා විරහිත භාවයට පිළිතුරක් වීමට හැකි වන පරිදි කාර්මිකකරණයක්ද

සිදු නොවීය. අනෙක් අතට කාර්මිකකරණයට අනුබලයක් වී ඊට තල්ලුවක් දෙනු පිණිස දේශීය වෙළඳපොළ සක්‍රිය කළ හැකි වන පරිදි කෘෂිකාර්මික ප්‍රගතියක් ඇති වූයේ ද නැත. විකල්පය වූයේ විදේශීය වෙළඳපොළ සොයා යාම ය. එක් පසෙකින් මැද-පෙරදිග රැකියා වෙළඳපොළ ය. අනෙක් පසින් නිමි භාණ්ඩ සඳහා ඇමෙරිකානු-යුරෝපීය වෙළඳපොළ ය.

කෘෂිකර්මයේ අවම යාන්ත්‍රිකකරණය සඳහා වුව ද අපි විදේශීය කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ මත යැපෙන්නට වීමු. එහි ප්‍රතිඵලය වූයේ, කෘෂිකර්ම-කර්මාන්ත අන්තර් සම්බන්ධතාව තුළින් ජනිත වන ආර්ථික ප්‍රතිලාභ, දේශීය භූමිභාගයෙන් ඔබ්බට තල්ලු වී යාමයි.

දුබල ව පැවති සාම්ප්‍රදායික කෘෂිකර්මයෙන් කෙසේ වුවත්, දියුණු මට්ටමකින් පැවති තේ හා රබර් ආදි වාණිජ වැවිලි අංශයේ ඒකරාශි වූ ප්‍රාග්ධනයෙන් වුව ද, රට තුළ සැලකිය යුතු කාර්මික ආයෝජනයක් කර නැති තරම් ය. ලංකාවෙන් පිටතට ගලා ගිය වතු වැවිලි අංශයේ අතිරික්ත ධනය හිස එසැවූයේ මවු රටේ (එංගලන්තයේ) පවත්නා ධන සම්භාරය හා සැප පහසුව තව තවත් වැඩි කරමින් එරට මහා මන්දිර සහ සුවිසල් ආයතන හරහා නොවේ දැයි ජෝන් ෆර්ගසන් සිය Ceylon 1884 නමැති කෘතියේ දී ප්‍රශ්න කරයි. එකල නවීන කෘෂිකර්මයක් වූ වතු වැවිලි ආර්ථිකය විසින් ලංකාව ඊළඟ උසස් පියවරවෙත ඔසවා තබනු නොලැබිණි. එනම් කාර්මිකකරණයට යොමු වූයේ නැත. එපමණක් නොව, මිනිරන් පතල් කර්මාන්තයේ ඒකරාශි වූ ප්‍රාග්ධනය ද මෙරට රැඳුණ බවක් පෙනෙන්නට නැත. සෙසු ලෝකය සමඟ කරනු ලබන ශ්‍රී ලංකා ආර්ථිකයේ ගනුදෙනුවල හැසිරීම් රටාව හා මූල්‍ය ප්‍රවාහයන් දෙස බලන්නකුට මීට සමාන තත්ත්වයක් අදටත් පවතින බව පෙනී යනු ඇත. වෙනස නම්, අද අතිරික්ත ධනය රඳවා තබන්නේ එංගලන්තයේ පමණක් නොවීම යි. ඒ සඳහා වඩා ආකර්ෂණීය හා ආරක්ෂිත ස්ථාන ගොඩ නැඟී තිබේ. ඒවායේ රඳවා තබන අතිරික්ත ධනය අවශ්‍ය වූ විටෙක ට්‍රෝජන් අශ්වයකු පිට නැඟුණු සැඟවුණු අමුත්තකු මාර්ගයෙන් ආපසු ගෙන්වා ගත හැකි ය. ජාත්‍යන්තරයේ ආශීර්වාදය ලැබෙන මෙම සැඟවුණු මූල්‍ය පටිපාටිය, ජාතික ආර්ථිකයන්හි වර්ධනය මන්දගාමී කිරීමට හේතු වී තිබේ.

කෘෂිකර්මයේ විෂය පරාසය අතිශයින් විශාල ය. සත්ත්ව පාලනය හා ධීවර කර්මාන්තය ද ඒ යටතට ගැනේ. ආර්ථික සංවර්ධනයේ ද, එහෙයින් ම අප මුහුණ පා සිටින මහා ජාතික අර්බුදය ජය ගැනීමේ ප්‍රයත්නයේ ද, පළමු පියවර තැබිය යුත්තේ කෘෂිකාර්මික ප්‍රගතිය මඟිනි. කෘෂිකාර්මික ප්‍රගතියේ පෙර ගමන්කරු වන්නේ ගොවියා ය. මේ ගමන යාමට ඔහු ගොවි ව්‍යාපාරික ප්‍රජාවක සාමාජිකයකු බවට පත් විය යුතුය, ඊට අයත් සළුපිළි ඇඳ පැළඳ ගත යුතු ය.

ආහාරයෙන් ස්වයංපෝෂිත වීම හා වගා සංග්‍රාම වැනි ජාතික වැඩ පිළිවෙළ කෙතෙක් තිබුණද කෘෂිකර්මය ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය විය යුතු ය යන ස්ථාවරයට අප පැමිණ සිටියේ නැත. 1980 දශකයේ සිට ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය පෞද්ගලික අංශය යැයි (Private sector is the engine of growth) කියන්නට අපි පටන්

ගත්තෙමු. එය අරිට්ය කීවෙණ්ඩුගේ මන්තරය මෙන් විය. වඩා සාර්ථක රාජ්‍ය අංශය ද, පෞද්ගලික අංශය ද යන්න විමසීම නිරර්ථක ය. 'කාර්යක්‍ෂම භාවය හා අකාර්යක්‍ෂමභාවය හුදෙක් රාජ්‍ය අංශය ද පෞද්ගලික අංශය ද යන්න සමඟ සම්බන්ධ කරුණක් නොවේ. එය පවතින පසුබිම පිළිබඳ ප්‍රශ්නයක් ද වේ. ඇතැම් පසුබිමක දී පෞද්ගලික අංශයත්, රාජ්‍ය අංශයත් යන දෙකේ ම ව්‍යාපාර අකාර්යක්ෂම විය හැකි ය. තවත් ඇතැම් පසුබිමක දී පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය යන දෙකම කාර්යක්ෂම විය හැකි ය. ඒ නිසා මේ ප්‍රශ්නයෙහි හරය පවතින්නේ එකකට වඩා අනිකෙහි වාසිය තිබෙන්නේ කොතැන ද යන කරුණ මත නොවේ. මෙහි නියම හරය පවතින්නේ පෞද්ගලික අංශයේ හෝ වේවා, රාජ්‍ය අංශයේ හෝ වේවා හැම ව්‍යාපාරයක ම, හැම ක්‍රියාවලියක ම කාර්යක්ෂමතාව ඉහළ මට්ටමකට නංවනු පිණිස පසුබිම වෙනස් කරන්නේ කෙසේද යන කරුණ මත ය. ප්‍රතිපත්ති සම්පාදකයන් විසඳා ගත යුතු මූලික අභියෝගය මෙය විනා වඩා සාර්ථක වන්නේ කවර අංශය දැ'යි තීරණය කිරීම නොවේ.'' (ආචාර්ය ගාමණී කොරයා, 1987).

අපේ පළමුවැනි කාර්යය විය යුත්තේ, කවර අංශයකට වුව ද සාර්ථක විය හැකි, නීති ගරුක, විනය ගරුක, වංචා-දූෂණයෙන් තොර, විනිවිද දැක්මෙන් යුතු, පිවිතුරු පසුබිමක් නිර්මාණය කිරීම යි. ඒ සමඟ ම ජාතික හා ගෝලීය තලයන්හි පවතින දේශපාලන හා ආර්ථික පරිසරයන් සැලකිල්ලට ගෙන කලින් කලට ඉදිරියට ගත යුත්තේ කවර අංශයේ ආර්ථික මෙහෙයුමක්දැයි හඳුනා ගැනීම යි. තවමත් අපට එය කෘෂිකර්මය යි. කෘෂිකර්මයේ පෙරමුණු බලඇණිය වූ ගොවියා සම්පූර්ණයෙන් ම පෞද්ගලික අංශයක් ලෙස ගණන් ගත හැකි ය. එහි පසුමුණ, එනම් උපදේශනය, පර්යේෂණය, නියාමනය හා ප්‍රවර්ධනය, මුළුමනින්ම වාගේ රාජ්‍ය අංශයේ ය.

වර්ෂ දෙදහස් ගණනාවක් තුළ ඒකරාශී කරගත් ජලාශ, වැව්, අමුණු, ඇළ-වේලි යනාදියෙන් සමන්විත ඓතිහාසික ප්‍රාග්ධනයත්, අපේ කෘෂි විද්‍යාඥයන්ගේ පර්යේෂණ හා පරිශ්‍රමයත්, කෘෂිකර්මයෙහි කරනු ලැබූ ආයෝජනත්, සහනාධාරත් නිසා අපි සහලින් ස්වයංපෝෂිත වීමේ මානයට පැමිණ සිටින්නෙමු. එය ජාතික න්‍යාය පත්‍රයේ එක් ජය කණුවකට ළඟා වීමකි. එසේ වුව ද, එම කාර්යයේ පෙරමුණු බලඇණිය වූ ගොවීන් බොහෝ දෙනෙකුට ගොවිතැන සරුසාර ආදායම් මාර්ගයක් වී නොමැත. අනෙක් අතට, පාරිභෝගිකයන් බොහෝ දෙනෙකුට ඉහළ නගින හාල් මිල දරාගත නොහැකි වී තිබේ. "දරාගත නොහැකි වී තිබේ" යන්නේ අදහස රුපියල් සතවලින් මිල වැඩි වී තිබීම යැ'යි සරලව නොගත යුතු ය. මෙහි ලා අර්ථාන්විත වන්නේ ජනතාවගෙන් බහුතරයකගේ ආදායමට සාපේක්ෂ ව සහල් මිල දෙස බැලීම ය. කෙනෙකුට පවත්නා මිල ගැන කිසිම ගැටලුවක් නැති විය හැකි ය. තවත් කෙනෙකුට එය බරපතළ ගැටලුවක් විය හැකිය. මෙතැනදී ඇඟිල්ල දිගු වන්නේ කෘෂිකර්මයේ සීමාවන් ඉක්මවා ගිය සමස්ත ආර්ථිකයට යි. බහුතරයක් ජනතාවගේ ආදායම් වැඩි කරගත හැක්කේ කෙසේදැයි පෙනෙන්නේ සමස්ත ආර්ථිකය දෙස විමසිලිමත්ව බැලූ විට ය.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය පිළි පැන ඇති බවත්, ප්‍රමුඛතා හඳුනාගැනීමේදී අඩුපාඩු හා අතපසු වීම් සිදු වී ඇති බවත් දැන් පෙනීයයි. බහුතර ජනතාවගේ දෘෂ්ටි කෝණයෙන් එය පිළි පැනීමක් වුව ද ඇතැම් සුළුතරයකට එය එසේ නොවිය හැකි ය.

සංවර්ධන-ආර්ථික චින්තාව පිළි පැන තිබෙන තවත් අවස්ථාවක් වන්නේ භාණ්ඩ අපනයනයට සීමාව ඉක්මවූ ප්‍රමුඛස්ථානයක් දීම යි. එම හේතුවෙන් දේශීය පරිභෝජනය සඳහා දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමට නිසි සැලකිල්ල දැක්වීමක් හා සම්පත් වෙන් කිරීමක් සිදු වී නැත.

"අපනයනය ඔබටත් රටටත් සෞභාග්‍යය ගෙනදේ" යන ආදර්ශ පාඨය මහ ඉහළින් රාව-ප්‍රතිරාව නැංවීය. ඒ බව කියැවෙන පුවරු 1980/90 දශකවල රට පුරා පිහිටවනු ලැබීය. මෙය "දුර දක්නා" මිනිසකු ඇත සංඥා පුවරුවක දැල්වෙන කොළ එළිය දෙස බලාගෙන, නමුත් මෑතම දැල්වෙන රතු එළිය නොතකා රිය පැදවීම හා සමාන ය . ඔහු අනතුරට ලක් වන බව අමුතුවෙන් කිව යුතු නැත. මේ පිළි පැනීම නොපමාව නිවැරදි කළ යුතුයි. **එහි මුල් පියවරක් ලෙස ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන, එනම් සැම කෙනෙකුටම අවශ්‍ය තරමට පෝෂ්‍යදායී ආහාර ලබා ගත හැකි වනු පිණිස, කෑම-බීම සුලබ හා සුමිල (සාපේක්ෂ ලෙස මිල අඩු) කළ හැකි නවීන කෘෂිකර්මයක් ස්ථාපනය කළ යුතුය. නොඑසේ ව, හාමතින් හෝ අඩ-හාමතින් හෝ පෙළෙන කායික-මානසික ශක්තියෙන් පිරුහුණ ජනතාවක් සමඟ සංවර්ධන සමීකරණය තුලනය කරගත නොහැකි ය.** දරිද්‍රතාවේ ගිලී ඇති 45%ක පිරිස විශේෂයෙනුත්, මුළු ජනගහනය ම පොදුවේත් ආරක්ෂා කරගත හැක්කේ එමඟිනි. **අපනයනය හා ඩොලර් ඉපැයීම ගැන කථා කරන බොහෝ දෙනා, එදා වේල සපයා ගත නොහැකි තරමට ම පහළට වැටී ඇති දේශීය පරිභෝජනය ඉහළ නැංවීමේ අරමුණ ඇති ව, දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමක් ගැන කථා නොකරති. ඔවුන්ගේ චින්තනය යොමු වී ඇත්තේ සියලු දෙනා එක් ව යන ගමනක් වෙත නොවේ, සියලු දෙනා පංගුකරුවන් වන සංවර්ධනයක් ගැන නොවේ.**

දේශීය පරිභෝජනය ඉහළ නැංවීම මගින් අපේ ජාතික නිෂ්පාදිතය (GDP) සහ ජාතික ආදායමද ඉහළට එසවිය හැකි බව අප වටහා ගත යුතුය. එය ප්‍රතිවර්ත්‍ය ප්‍රතික්‍රියාවක් බඳු ය. එනම්, පළමුවැන්න දෙවැන්නට ද, දෙවැන්න පෙරළා පළමුවැන්නට ද, නිරතුරුව ම බලපෑම් කරයි. එයින් ලැබෙන ප්‍රතිඵල සියලු දෙනාට ම අත් වේ. ඒ සඳහා විප්ලවයක් යැයි කිව හැකි තරමේ නිර්මාණශීලී පරිවර්තනයක්, මහා වඩදිය රැල්ලක් ඇති කළ යුතුය. නැඟෙන රළට සියලු බෝට්ටු ඉහළට එසවිය හැකි වෙනවා ඇත. **(a r**ising tide can lift all boats). කෘෂිකර්මය හා ගොවි ජනතාව ඉසුරුබර කළ හැකි වන්නේ එලෙස ය.

"සංවර්ධනය" යනුවෙන් අප දකින්නට බලාපොරොත්තු වන්නේ, දේශීය හෝ විදේශීය හෝ ප්‍රාග්ධන හිමියන්ට ගොවීන්ගේ ඉඩම් පවරා දී, අක්කර දහස් ගණන් විශාල වූ වගාවන් ඇති කර, ඒවාට හෙලිකොප්ටර් යානාවලින් බෙහෙත් හා පොහොර ඉසිනවා වැනි, මහා පරිමාණ කෘෂිකර්මයේ මනස්කාන්ත විචිත්‍ර චිත්‍ර නොව, අපේ ගොවීන් විසින් ම මහා පරිමාණයේ වාසි බුක්ති විඳිනු ලැබීම ය.

ඉතිහාසය විසින් නියම කරනු ලැබ තිබෙන මේ උසස් අවස්ථාවට ගොවිතැන පත් කරන්නේ කෙසේද යන්න මෙම ලිපියේ සාකච්ඡාවට භාජනය කෙරේ. ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ ජීවනෝපාය සලසන්නා වූ ද ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවේ තීරණාත්මක සාධකයක් වූ ද වී ගොවිතැනින් අපේ සාකච්ඡාව පටන් ගනිමු.

2. හාල් මිල සමීකරණය

අද සිදුවන්නේ කුමක් ද? 'නිදහසින්' පසු ඉතිහාසය පුරාම නැඟුණු හඬ, එනම් 'පාරිභෝගිකයාට හාල් මිල වැඩි ය, ගොවියාට වී සඳහා ලැබෙන මිල අඩු ය' යන දෝෂාරෝපිත පැමිණිල්ල යළි යළිත් ප්‍රතිරාව නැංවීම යි. **පාරිභෝගිකයාට හාල් මිල වැඩි ලෙසක් දැනෙන්නේ ඔහුගේ ආදායම ප්‍රමාණවත් නොවන නිසාය. ගොවියාට වී සඳහා ලැබෙන මිල අඩු ලෙසක් දැනෙන්නේ ඔහුගේ නිෂ්පාදන වියදම් වැඩි නිසා ය, ලැබෙන මිල ණය බර විසින් ඔහුගේ අතේ දී අවප්‍රමාණය කරනු ලබන නිසා ය. මෙම උභතෝකෝටිකය විසඳන්නේ කෙලෙස ද?** එළවළු ඇතුළු බොහෝ කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන්ද දිගින් දිගට ම මෙවැනි දෝෂාරෝපිත පැමිණිලි අසන්නට ලැබේ. එවැනි අවස්ථාවලදී ගැටලුව දෙස මතු පිටින් බලන කාගේත් පහසු ඉලක්කය බවට පත් වී ඇත්තේ අතරමැදියා ය. ඔහු වැරදිකරු කරමින් ඒක පාර්ශ්වීය තීන්දුවක් දී තිබේ.

අතරමැදියා විශාල සේවයක් කරන්නෙකි. පොළොන්නරුවේ කුඹුරකින් නිපදවනු ලැබූ වී, ගල් වැලි ඉවත් කළ හාල් බවට හරවා පාරිභෝගිකයාට සැපයීමට ද බණ්ඩාරවෙල කඳු පල්ලමක වැවුණ එළවළුවක් පාරිභෝගිකයා වෙත පැමිණවීමට ද අතරමැදියෝ ගණනාවක් සහභාගී වෙති.

ගොවියාට ලැබෙන මිලත් පාරිභෝගිකයා ගෙවන මිලත් සංසන්දනය කරමින් අඬහැර තැබීමට විනා, අතරමැදි සේවාවන් කාර්යක්ෂම ව හා අඩු පිරිවැයකින් කරන්නට සලස්වන්නේ කෙසේද යන ගැටලුවට පිළිතුරු සෙවීමට කිසිවකු සමත් වී නැත. බත සපයන ගොවියා සම්බන්ධයෙන් අප ගොඩ නගන මෙම කතිකාව හා විසඳුම් මාර්ගය, අනෙකුත් කෘෂිකාර්මික අංශවලට ද එළියක් සපයනු ඇත.

හාල් මිල සහ වී මිල සමීකරණය විසඳූ විට හැමදා ම ලැබුණ උත්තරය පාරිභෝගිකයාත් ගොවියාත් යන දෙදෙනාම සෑහීමට පත් නොවීමත්, මූලික ම අවශ්‍යතාවක් වූ ආහාර සුරක්ෂිතතාව දිගින් දිගට ම පවත්වා ගත නොහැකි වීමත් ය. ආහාර සුරක්ෂිතතාව යනු සැම දෙනාටම, හොඳ තත්ත්වයේ පෝෂණීය ආහාර, අවශ්‍ය තරමට ලබා ගැනීමට ඇති හැකියාව යි. 'ලබා ගැනීමට ඇති හැකියාව' තහවුරු කෙරෙන ප්‍රධාන ම සාධකය මිල යි. හාල් සම්බන්ධයෙන් ගත් කල ආහාර සුරක්ෂිතතාව බිඳී ගොසිනි. ජනතාවගෙන් බහුතරයකට හාල් මිල දැරිය නොහැකි ය. ඇතැම් අවස්ථාවන් හි දී හාල් හිගය.

හාල් සහ වී මිලටත්, ආහාර සුරක්ෂිතතාවටත් බලපාන එක්වර විසඳිය යුතු සමගාමී සමීකරණ ගණනාවකි. එකක් හෝ දෙකක් හෝ පමණක් විසඳා හරි පිළිතුරක් ලබා ගත නොහැකි ය. කල් පවත්නා සම්පූර්ණ විසඳුමක් ලබා ගත නොහැකි ය. මෙම සමගාමී සමීකරණ සමූහයේ අන්තර්ගත පද පහත දක්වා ඇත.

1. පළමු ව, ගොවියාගේ නිෂ්පාදන පිරිවැයට බලපාන (a) ගොවිබිමේ ප්‍රමාණය හා සැකැස්ම, (b) ශ්‍රම සැපයුම (c)යෙදවුම් වෙළඳපොළ සේ ගැනෙන බිත්තර වී, පොහොර, වල් නාශක හා කෘමිනාශක සැපයීම, (d) සේවා වෙළඳපොළ සේ ගැනෙන ට්‍රැක්ටර් හා වෙනත් යන්ත්‍රෝපකරණ සැපයීම, (e) ඇළවේලි හා වැව් අමුණු නඩත්තුව හා ප්‍රතිසංස්කරණ ඇතුළත් ජල සම්පාදනය, (f) ප්‍රාග්ධන සම්පාදනය, (g) අස්වනු නෙළීම

(h) අපද්‍රව්‍ය ඉවත් කිරීම හා වියළීම යන කාර්යයන් ඇතුළු විකිණීම සඳහා අස්වනු සකස් කිරීම සහ (i) ගබඩා කර තැබීම හා අස්වනු ආරක්ෂණය,

2. දෙවනු ව, කමතේ සිට සහල් නිෂ්පාදනය දක්වා කටයුතු (j) වී ප්‍රවාහණකරුවන්, (k) වී එකතු කරන්නන් හා බ්‍රෝකර්වරුන් , සහ (l) සහල් නිෂ්පාදන කර්මාන්තශාලා

3. තෙවනුව, (m) කෘෂි උපදේශනය, (n) යටිතල පහසුකම් සැපයීම, (o) පොහොර සහනාධාරය, (p) සහතික මිල නියම කිරීම, සහ (q) වී අලෙවි මණ්ඩලය මගින් වී මිලට ගැනීම යනාදි රාජ්‍ය මැදිහත් වීම.

4. සිවුවැනි ව, (r) බෙදා හැරීම, සහ (s) තොග සහ සිල්ලර වෙළඳාම ඇතුළත් සහල් වෙළඳපොළ. මේ අවස්ථාවේදී කෙරෙන, මිල පාලනය, වැටලීම, නඩු දැමීම හා දඩ ගැසීම යනාදි රාජ්‍ය මැදිහත් වීම විසඳුමක් නොවන බව සත්‍ය සිදුවීම්වලින් ඔප්පු වී තිබේ.

හාල් සමීකරණ සමූහය අතරින්, අපි පළමුවෙන් ම ගොවියාගේ නිෂ්පාදන පිරිවැය විසඳෙන සී සෑමේ සිට අස්වැන්න නෙළා ගැනීම හා විකිණීම සඳහා සකස් කිරීම තෙක් වූ ක්‍රියාවලිය සලකා බලමු. ගොවිබිමේ ප්‍රමාණය හා සැකැස්ම, ශ්‍රම සැපයුම, බීජ, පොහොර හා අනෙකුත් යෙදවුම්, ට්‍රැක්ටර් හා අනෙකුත් යන්ත්‍රෝපකරණ කුලිය, වගාව නඩත්තු කිරීම, අස්වනු නෙළීම, විකිණීම සඳහා අස්වැන්න සකස් කිරීම (අපද්‍රව්‍ය ඉවත් කිරීම හා වියළීම ඇතුළු ව), ගබඩා කිරීම හා පසු අස්වනු ආරක්ෂණය යන කටයුතුවලින් එම ක්‍රියාවලිය සමන්විත වේ. ගොවිබිම් කුඩා ඉඩම් කැබලි ලෙස විසිරී පැවතීම, අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල පිරිසක් ගොවිතැනට සම්බන්ධ වී සිටීම, යෙදවුම් හා සේවා වෙළඳපොළ අධික මිල ගණන් හා අකාර්යක්ෂමතාව, තරුණ තරුණියන් ගොවිතැන හැරයාම හා ග්‍රාමීය ණයගැති භාවය යන සම්බාධක වල අනිටු බලපෑමට ලක් වී තිබෙන මෙම ක්‍රියාවලිය ආර්ථික, සමාජීය හා පාරිසරික වශයෙන් චිරස්ථායි ලෙස හැඩගස්වා ගත යුතුය.

ඒ සඳහා තිබෙන්නා වූ කාලීන හා ප්‍රායෝගික විසඳුම කුඩා ඉඩම් කැබලි ලෙස විසිරී පවතින ගොවිබිම් ඒවායේ අයිතිකරුවන්ගේ කැමැත්තෙන්, ආර්ථික වශයෙන් ඵලදායි තනි විශාල ගොවිබිමක් ලෙසට ඒකාබද්ධ කර, වගා කටයුතු කරගෙන යාමට ගිවිස ගන්නා "එක යායක් - එක කළමනාකරණයක්" යන තේමාව යටතේ ඒකරාශී වූ ගොවි ව්‍යාපාරික ප්‍රජාවක් ඇති කිරීම ය. ඉතිහාසය විසින් නියම කර තිබෙන ඊළඟ උසස් අවදියට අපේ කෘෂිකර්මය ගෙන යා හැකි වාහකය එය යි. පීලි පැන තිබෙන සංවර්ධන-ආර්ථික චින්තාව නිසි තැන පිහිටුවා, ආර්ථික වර්ධන වේගය කීප ගුණයකින් වැඩි කිරීමට මුල පුරන සංවිධාන ශෛලීය එයයි. එසේ නොකරන තාක් වී සඳහා ලැබෙන මිල ගොවියාට ප්‍රමාණවත් හා සතුටුදායක ලාභයක් ගෙන නොදෙයි.

3. එක යායක් - එක කළමනාකරණයක්

‘එක යායක් - එක කළමනාකරණයක්’ යනු, එකිනෙකට ආසන්න ව පිහිටා ඇති (එකට යාකර ගත හැකි) ගොවිබිම් (කුඹුරු ඉඩම්) සමූහයක් ඒවායේ අයිතිකරුවන්ගේ කැමැත්තෙන්, පෞද්ගලික ඉඩම් අයිතියට කිසිදු අගතියක් නොවන පරිදී, තනි විශාල ගොවිබිමක් ලෙසට ඒකාබද්ධ කර, එක කළමනාකරණයක් යටතේ වගා කටයුතු කරගෙන යාමට පිහිටුවා ගන්නා සමාජ - ව්‍යවසායක (social enterprise) සංවිධාන ආකෘතියකි.

ගොවිබිමක් යනුවෙන් මෙහි සඳහන් කර ඇත්තේ එක් අයිතිකරුවකු හෝ අඳ ගොවියකු හෝ විසින් වගා කරනු ලබන ඉඩම් කට්ටියකි. අත්හදා බැලීමේ පළමු පියවරේ දී එම සංවිධානය ලිහිල් බැඳීම් සහිත ගොවි සාමූහිකයක් වේ. එය සීමිත කාර්යයන් සහ අරමුණු වෙනුවෙන් පිහිටුවා ගන්නා හවුල් ව්‍යාපාරයකට සමානය. ගොවීන් ව්‍යාපාරික ප්‍රජාවක් බවට පත්වීමේ ආරම්භය එ මඟින් සටහන් වේ. ගොවි සාමූහිකයක් ලෙසට සංවිධානය වී ‘එක යායක් - එක කළමනාකරණයක්’ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම මඟින් මුදුන්පත් කරගත හැකි අරමුණු බොහෝය:

1. බිම සකස් කිරීම, බීජ/පැළ රෝපණය, පොහොර යෙදීම, ජල කළමනාකරණය, වල්පැළ හා පලිබෝධ නාශනය, අස්වනු නෙළීම, පසු අස්වනු ආරක්ෂණය, ගබඩා කිරීම හා අලෙවිය යන කාර්යයන් එක් එක් ගොවියා විසින් වෙන වෙන ම කරනු ලබනවාට වඩා පහසුවට, විධිමත් ව හා අඩු පිරිවැයකින් කරගත හැකි වීම එනම්, මහා පරිමාණයේ වාසි (economies of scale) ලබා ගත හැකි වීම.

2. නවීකරණයට, එනම්, උචිත තාක්‍ෂණය හා නව භාවිතාවන් (modern practices) යොදා ගැනීමට හැකි වීම මගින් පලදාව වැඩි කරගත හැකි වීම.

3. යායක වපසරිය අක්කර 75-100ක් වන අවස්ථාවක ස්ථිර කාර්ය මණ්ඩලය ලෙස දෙදෙනෙකු ප්‍රමාණවත් විය හැකි නිසා ගොවිබිම් හිමි වැඩි පිරිසකට එදිනෙදා ගොවිතැන් කටයුතුවලින් නිදහස් වී වෙනත්ට ආර්ථික කටයුතුවල යෙදීමට හෝ ශ්‍රම වෙළඳපොළට එකතු වීමට හෝ අවස්ථාව ලැබීම. එමඟින් වගා කැලැන්ඩරයට සීමා නොවූ කෘෂිකාර්මික නොවන ආදායම් මාර්ග විවෘත කර ගැනීම.

4. ස්ථිර කාර්ය මණ්ඩලයක් සිටින නිසා, “කිලෝ මීටර්වලින් නොව මිලි මීටර්වලින් මැනීමේ” උපදේශය ක්‍රියාවට නඟමින් හැම බිම් අඟලක් ම හා හැම දිය බිඳුවක් ම උපරිම ලෙස භාවිත කිරීමටත්, යාය තුළ පිහිටි වගා නොකර අතහැර දමා ඇති ගොවිබිම් වගා කිරීමටත්, ප්‍රධාන කන්න දෙක අතරතුර කාලයේ වෙනත් කෙටි කාලීන වගා කටයුතු සඳහා ඉඩම් උපයෝගී කර ගැනීමටත් හැකි වීම .

5. කුඹුරු යායක වගා කටයුතු එක ම කාල සටහනකට කිරීම නිසා කෘමි උවදුරු අවම කර ගත හැකි වීම (ඒකාබද්ධ පලිබෝධ පාලනය) හා ජල කළමනාකරණය ප්‍රශස්ත මට්ටමක තබා ගත හැකි වීම.

6. පාංශු සංරක්ෂණය හා පාංශු පුනරුත්ථාපන කටයුතු මුළු යාය තුළ ම එකවර ක්‍රියාත්මක කළ හැකි වීම මඟින් කුඹුරු පසේ භෞතික හා රසායනික ගුණාංග ඉහළ නැංවිය හැකිවීම

7. එක් එක් ගොවියා වෙන වෙනම කටයුතු කිරීමේ දී බොහෝ විට නිර්දේශිත ප්‍රමාණ ඉක්මවා රසායනික පොහොර, කෘමිනාශක, වල්නාශක ආදිය භාවිත කරනු දක්නට ලැබේ. එමඟින් මුදල් නාස්ති වන අතර පරිසර හානි උග්‍ර වේ. (උදාහරණයක් ලෙස වගාවට හිතකර කෘමීන් විනාශ වී යෑම) ගොවි සාමූහිකයක්/ ගොවි සමාගමක් ලෙස නිර්දේශිත ප්‍රමාණය පමණක් භාවිත කිරීමෙන්, එවැනි ගැටලු ජය ගත හැකි වීම.

8. කන්න රැස්වීම් කටයුතු සරල හා වඩාත් ඵලදායී වීම. රැස්වීම් හා පුහුණු වැඩසටහන් සඳහා පිරිස් වශයෙන් එක් විය යුතු අවස්ථා අවම වන බැවින්, වැය කළ යුතු කාලය, ශ්‍රමය හා වියදම් අවම වීම.

9. කුඹුරුවල ඇළ වේලි ඇතුළු වාරිමාර්ග නඩත්තුව හා ප්‍රතිසංස්කරණ, ක්‍රමානුකූල ව හා කලට වේලාවට කර ගත හැකි වීම

10. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි, කෘ.ප.නි.ස., කෘෂිකර්ම උපදේශක, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි ඇතුළු තාක්ෂණික වශයෙන් හෝ පරිපාලනමය වශයෙන් හෝ වී වගාවට සම්බන්ධ නිලධාරීන්ට සංවිධානය වූ කණ්ඩායමක් සමඟ කටයුතු කළ හැකි වන නිසා ඔවුන්ගේ හා ඒ ආයතනවල සහභාගීත්වය පහසු කරවීම.

11. උපදේශනය ද ඇතුළු රාජ්‍ය හා අවශේෂ අංශවලින් සැපයෙන සම්පත් දායකත්වය කාර්යක්ෂම වීම.

12. ගොවිබිම්හි අයිතිකරුවන්ට තමන් විසින් පිහිටුවා ගනු ලබන ගොවි සාමූහිකයේ (හෝ ගොවි සමාගමේ) සාමාජිකයන් ලෙස තම තමන්ගේ පෞද්ගලික ගොවිබිම් අධීක්ෂණය කළ හැකි වීම, අඩුපාඩු හා දුර්වලතා නිවැරදි කර ගැනීම පිණිස අධ්‍යක්ෂක මණ්ඩලය හරහා කළමනාකරණයට උපදෙස් දිය හැකි වීම හා එමගින් කළමනාකරණ විගණන සේවයක් ලෙස ක්‍රියාත්මක විය හැකි වීම .

4. ගොවි සමාගමේ යුග මෙහෙවර

අත්හදා බැලීමේ අවස්ථාවේ දී පිහිටුවාගත් ගොවි සාමූහිකයේ විෂයපථය පුළුල් කර ඉදිරියට යාමට ගොවීහු එකඟ වෙත් නම් ඒ සඳහා ගත යුතු ඊළඟ පියවර ගොවි සමාගමක් පිහිටුවා ගැනීම යි . ඒ සඳහා එකඟ වන එක් එක් ගොවියාට, තම ඉඩමේ ප්‍රමාණයට සමානුපාතික ව සමාගමේ කොටස් නිකුත් කළ යුතුය . ඉඩමේ අයිතිය සමාගමට පැවරීමක් සිදු කරන්නේ නැත. එහෙත් ගොවියා සමාගමේ සාමාජිකත්වය දරන තාක් හා ඔහුගේ මනාපය පවතින තාක් ඔහුගේ ඉඩම ද ඇතුළත් ඉඩම් යාය වගා කරන්නේ සමාගම මගිනි. ඉඩමේ පෞද්ගලික අයිතිය එලෙසම පවතිද්දී එහි වටිනාකමට සමාගමේ කොටස් නිකුත් කිරීම ඇතුළු අනෙකුත් විශේෂිත ප්‍රතිපාදන පැනවෙන නව ගොවි සමාගම් පනතක් සම්මත කළයුතු වේ. එවැන්නක සඳහන් විය යුතු මූලික කරුණු "ගොවි සමාගම් පනත" ඇමුණුමෙහි දක්වා ඇත.

රට පුරා පිහිටුවා ගත යුතුව තිබෙන දහස් ගණනක් ගොවි සමාගම් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආර්ථිකයක පවුරු පදනම් ශක්තිමත් කරයි. ණය ගැති භාවයේ වියගසින් ග්‍රාමීය ජනයා මුදවා ගනී. වාර්ෂික ආර්ථික වර්ධන වේගය සිතා ගත නොහැකි තරමට ඉහළ නංවයි. ආර්ථික විශේෂඥයින්ගේ 3-5% න්‍යායික සීමා කඩා බිඳ දැමේ.

"එක යායක් - එක කළමනාකරණයක්" යටතේ දක්වා තිබෙන ප්‍රතිලාභ වලට අමතර ව, ගොවි සමාගම් මඟින් මුදුන්පත් කරගත හැකි අරමුණු පහත දක්වා ඇත.

1. පර්යේෂණ දිරි ගැන්වීම, නව තාක්ෂණික භාවිතයන් උපයෝගී කර ගැනීම හා ආකර්ෂණීය සමාගම් ධුරාවලිය මඟින් උගත් තරුණ තරුණියන් කෘෂිකර්මයට සම්බන්ධ කරගත හැකි වීම.

2. ඉදිරි වර්ෂ කීපයක දී ඉපයිය හැකි බවට පුරෝකථනය කරන ආදායම ඇපයට තබා බැංකු ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් රාජ්‍ය අනුග්‍රහයෙන් සම්පාදනය කර ගැනීම. (තනි තනි ව ගොවීන්ට මෙවැනි අවස්ථාවක් ලබා ගැනීම අසීරු ය).

3. සමාගම මඟින් ගොඩනඟා ගන්නා මූල්‍ය සංචිත සහ බැංකු පහසුකම් මාර්ගයෙන් සාමාජිකයන් අධි පොළී ණයගැති භාවයෙන් මුදවා ගැනීම පිණිස සහන පොළී ණය ක්‍රමයක් ඇති කර ගැනීම.

4. වෙළඳපොළින් නිශ්චය කරනු ලබන මිල ගණන්වලින් ගොවියාත් පාරිභෝගිකයාත් යන දෙදෙනා ම සෑහීමට පත් වන ආර්ථික පරිසරයක් ඇති වීම.

5. වර්ෂ දෙකක හෝ තුනක හෝ සාර්ථක ක්‍රියාකාරීත්වයකින් පසු ව රජයේ සහනාධාර අනවශ්‍ය වන තත්ත්වයක් උදා කරගත හැකි වීම. මේ සඳහා පූර්ව කොන්දේසියක් වන්නේ කෘෂිකර්මාන්තය බද්දට යටත් නොකිරීම යි. ට්‍රැක්ටර් හා කෘෂි යන්ත්‍රෝපකරණ ආනයනයේදී හා නිෂ්පාදනයේදී පනවන බදු, ට්‍රැක්ටර් හා යන්ත්‍රෝපකරණ කුලියට එකතු වන බැවින්, එය ගොවියා අනියමින් ගෙවන බද්දකි..

6. අහිතකර හෝ ආක්‍රමණකාරී හෝ වෙළඳපොළ තත්ත්වයන් ඇති වන අවස්ථාවල දී රජයේ මැදිහත් වීම පහසු කරන ආයතන ව්‍යුහයක් ලෙස ක්‍රියා කිරීම.

7. වගා රක්ෂණය හා ඉදිරි ගිවිසුම් (forward contracts) වැනි වාණිජමය රැකවරණ ලබා ගැනීමට අවශ්‍ය සංවිධානාත්මක පසුතලය ඇති වීම.

8. ට්‍රැක්ටර් ඇතුළු කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සම්පූර්ණයෙන් ම බදුවලින් නිදහස් කිරීම ආර්ථික වර්ධනය සඳහා ගත යුතු අවශ්‍ය ම පියවරකි. එසේ කළ නොහැකි නම් එම පහසුකම ගොවි සමාගම්වලට දිය යුතු ය. උදාහරණයක් ලෙස තමන් යටතේ ඇති ගොවිබිම්වල වපසරිය (ප්‍රමාණය) අනුව නිශ්චය කරනු ලබන ට්‍රැක්ටර් සංඛ්‍යාවක් බදු රහිතව මිලදී ගැනීමට සමාගම්වලට අවසර දීම.

9. ප්‍රාථමික/ප්‍රාදේශීය කුඩා සමාගම්වල එකතුවෙන් ජාතික ගොවි සම්මේලනයක් දක්වා ගමන් කළ හැකිය. එවිට ජාතික වශයෙන් පමණක් නොව ගෝලීය වශයෙන් මහා පරිමාණයේ වාසි සලසා ගත හැකි ය. බීජ හා රෝපණ ද්‍රව්‍යත් අලෙවිකරණයත් ගොවියාගේ පූර්ණ පාලනය යටතට ගැනීමට හැකි වන්නේ එවිට ය.

10. ජාතික මට්ටමේ සංඛ්‍යා ලේඛන සකස් කිරීම පහසු වීම හා ඒවායේ නිරවද්‍යතාව ඉහළ යාම.

11. සූර්ය බල ශක්ති නිෂ්පාදනය වැනි ක්‍රියා මාර්ගවලට පිවිසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ හැකි වීම.

12. නව තාක්‍ෂණයට තෝතැන්නක් වෙමින්, කෘෂි - පාදක සැකසුම් කර්මාන්ත වලට පිවිසීමට හැකි වීම.

5. ග්‍රාමීය ණයගැති භාවය

හාල් සමීකරණ සමූහයේ තවත් ප්‍රබලතම පදයක් වන්නේ ග්‍රාමීය ණය ගැති භාවය යි. ගොවියාට ලැබෙන වී මිල, ණය බර විසින් ඔහුගේ අතේ දී අවප්‍රමාණය කරනු ලබයි. මෙය සමාජ-ආර්ථික-සංස්කෘතික පරිසරය යටතේ සාකච්ඡාවට ගත යුත්තකි.

ණයගැති භාවය හා ආරම්භක ප්‍රාග්ධනය නොමැති වීම, ගොවීන් බහුතර පිරිස මුහුණදෙන, එකිනෙක හා *බැඳී* **පවතින ප්‍රධාන ම ප්‍රශ්නයකි. වගා කන්නය පටන් ගන්නා මොහොතේ සිට ගොයම් කැපූ සැණෙකින් ම වී ටික විකුණා ගන්නට නොඉවසිල්ලෙන් බලා සිටින මොහොත දක්වා ම, ණය ගැති භාවය ගොවියාට බලපෑම් කරමින් ඔහුට ආවේශ වී සිටී. මේ මාතෘකාව ගැන පසුගිය දශක ගණනාවක් තිස්සේ බොහෝ දේ ලියා තිබේ. බොහෝ දේ ක්‍රියාවට නංවා තිබේ. එහෙත් සෑහීමකට පත් විය හැකි විසඳුමක් ලැබී නැත. යෝජිත ගොවි සමාගම් ක්‍රියාන්විතය, ග්‍රාමීය ණයගැති භාවය ජය ගැනීමේ ප්‍රාරම්භයක් කරගත හැකි ය.**

ගොවීහු තම ගොවිබිම් උකස් කර ණය ලබා ගනිති. ණය ගෙවා නිම නොවන තුරු, උකස් ණය හිමියා, වගා කිරීමේ අයිතිය උකස් ණයේ පොළිය ලෙසට ලබා ගනී. වගාවේ සම්පූර්ණ ලාභය ඔහුගේ ය. එය බැංකු පොළිය මෙන් කීප ගුණයකි. තවත් ඇතැම් අවස්ථාවල දී ව්‍යාපාරිකයන්, රාජ්‍ය, බැංකු හා පෞද්ගලික අංශවල නිලධාරීන් වැනි ප්‍රාග්ධන හිමියෝ වගා කිරීම සඳහා ගොවීන්ගේ ඉඩම් බද්දට ගනිති . මේ අවස්ථා දෙකේ දී ම වැඩි ගොවිබිම් ප්‍රමාණයක් වගා කිරීමේ අයිතිය අත්පත් කර ගැනීම මඟින් ඔවුන්ට (බදු හිමියාට සහ උකස් හිමියාට) මහා පරිමාණයෙන් වගා කිරීමේ වාසි ලබා ගත හැකි ය. ගොවියා බොහෝවිට ඔහු උකස් කළ හෝ බද්දට හෝ දුන් ඉඩමේ අඳ ගොවියකු හෝ කුලී කරුවකු (වැටුප් ශ්‍රමිකයකු) හෝ බවට පත්වී, අඳ ගොවියාට හිමි පංගුව හෝ වැඩ කුලිය හෝ ලබා ගනී. ඉඩම් වගා කරන්නාවූ මේ සැකැස්ම, මහා පරිමාණයේ වාසි ලබා ගැනීමට තිබෙන ගොවිජන කේන්ද්‍රීය ක්‍රමයක් නොව ප්‍රාග්ධන කේන්ද්‍රීය ක්‍රමයකි, ගොවියා ප්‍රාග්ධනයේ වියගහට බැඳ තබන ක්‍රමයකි. අනෙක් අතට මෙය දිගු කාලීන වශයෙන් ඉහළ ම ප්‍රතිලාභ සලසන ක්‍රමයක් නොවේ. කුමක් නිසාද? උකස් ණය හිමියාට හෝ බදු හිමියාට හෝ ඉඩමේ අයිතිය නොමැති නිසා, දිගුකාලීන ව ඉඩම සශ්‍රීක ව පවත්වාගෙන යාමේ වුවමනාවක් ඔහුට නැති බැවිනි.

වගා කිරීම ප්‍රධාන ජීවනෝපාය නොව අතිරේක ආදායම් මාර්ගයක් පමණක් වන අවස්ථාවලදී, ප්‍රාග්ධනය නොමැති වීම බරපතළ ප්‍රශ්නයක් ලෙස මතු නොවන බව සාමාන්‍යයෙන් පෙනී ගොස් තිබේ. මේ තත්ත්වය බොහෝ දුරට දකින්නට ලැබෙන්නේ, ගොවීන් ගොවිතැනට අමතර ව වැටුප් ලබන සේවකයන් බවට හෝ වැටුප් ලබන සේවකයන් රැකියාවට අමතරව ගොවීන් බවට හෝ පත් වූ විට ය. ගොවිතැන එක ම ජීවනෝපාය කරගත් ගොවීන් මුහුණ දෙන තරමට, ණයගැති භාවයේ ඛේදවාචකයට ඔවුන් ගොදුරු වී නැත.

ණයගැති භාවය සහ යහපැවැත්ම කෙරෙහි එක් ව හෝ වෙන් වෙන් ව හෝ බලපෑම් කරන්නාවූ තවත් සංසිද්ධි දෙකක් ගැන අප කල්පනාකාරී විය යුතුය. එකක් මත්ද්‍රව්‍ය ලෝලීත්වය යි. අනික සාවද්‍ය පරිභෝජනය යි. මේ දෙක ම වසංගත බඳු ය, මේවායින් ආසාදනයට ලක් වූ කෙනෙකුගේ වියදම් රටාවට සැලකිය යුතු බලපෑමක් කරයි. කවර තරමේ ආදායමක් උපයා ගත්ත ද ඇතැයි යන හැඟීමක් ඔහුට හෝ ඇයට නොදැනේ. ණයගැති භාවයේ ගැටලුවට මූලික වශයෙන් ආර්ථික තලයේ විසඳුම් ඉදිරිපත් කරන අතර ම මත්පැන් උවදුර හා සාවද්‍ය පරිභෝජනය නමැති සමාජීය වසංගතය පිළිබඳ නොපමාව කටයුතු කළ යුතුව තිබේ. ලැබෙන මිල අඩු ලෙස ගොවියාට පෙනෙන්නටත්, ගෙවන මිල වැඩි ලෙස පාරිභෝගිකයාට දැනෙන්නටත් මේ වසංගතයට ගොදුරු වීම ද,හේතුවක් වී තිබේ.

6. *ගොවි ව්‍යාපාරික ප්‍රජාව*

මීට ඉහත සඳහන් කළ පරිදී, අද අපේ ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය කර ගත යුත්තේ කෘෂිකර්මය යි. කෘත්‍රිම බුද්ධිය (AI) හා තොරතුරු තාක්‍ෂණය (ICT) ගැන සතුටින් කථා කරමින් සිටිය හැක්කේ ආහාර සුරක්ෂිතතාව ගැන අර්බුදයක් නැත් නම් පමණ ය. අංක එකට එන්නේ ආහාර යි. ආර්ථික සංවර්ධනය හිටගන්නේ කෘෂිකර්මය හා කර්මාන්ත නමැති දෙපයිනි. කෘෂිකර්මය ශක්තිමත්, ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කිරීම සඳහා ගොවියා, ගොවි ව්‍යාපාරික ප්‍රජාවක සාමාජිකයකු ලෙස සිතන්නටත්, ක්‍රියා කරන්නටත් පටන් ගත යුතු ය. ඒ සඳහා ගොවියාගේ ඉඩම් අයිතිය සුරක්ෂිත ව තබා ගනිමින්ම "එක යායක් - එක කළමනාකරණයක් " යටතේ දක්වා ඇති ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඉඩ සලසන සංවිධාන ක්‍රමයක් සකස් කරගත යුතු ය.

අත්හදා බැලීමේ පළමු පියවරේදී පිහිටුවා ගන්නා ගොවි සාමූහිකවල ක්‍රියාකාරිත්වය ඇගයීමෙන් පසු ගත යුතු ඊළඟ පියවර, ප්‍රාථමික මට්ටමේ ගොවි සමාගමක් පිහිටුවා ගැනීම ය. ඒ සඳහා එකඟ වන එක් එක් ගොවියාට, තම ඉඩමේ ප්‍රමාණයට සමානුපාතික ව සමාගමේ කොටස් නිකුත් කළ යුතු ය . ඉඩමේ අයිතිය සමාගමට පැවරීමක් සිදු කරන්නේ නැත. එහෙත් ගොවියා සමාගමේ සාමාජිකත්වය දරන තාක් හා ඔහුගේ මනාපය පවතින තාක් ඔහුගේ ඉඩම ද ඇතුළත් ඉඩම් යාය වගා කිරීමේ අයිතිය සමාගම සතු වේ. ඉඩමේ පෞද්ගලික අයිතිය එලෙස ම පවතිද්දී එහි වටිනාකමට සමාගමේ කොටස් නිකුත් කිරීමට හැකි වන ලෙසට ප්‍රතිපාදන පැනවෙන නව ගොවි සමාගම් පනතක් සම්මත කළයුතු වේ.

සමාගමේ ලාභය කොටස් අයිතියට අනුපාතික ව බෙදාගැනීම් නිසා ඉඩම් අයිතියට සමානව ප්‍රතිඵල භුක්ති විඳීම දිගට ම තහවුරු වේ. සමාගමේ කොටස් හිමියන් වන ගොවීන් විසින් සමාගම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්

කර ගත යුතු අතර දැනුම හා පළපුරුද්ද ඇති පූර්ණ කාලීන කළමනාකාරීත්වයක් යටතේ වගා කිරීම ද ඇතුළු දෛනික කටයුතු කරගෙන යා යුතු ය.

ඇමුණුම 1 : ගොවි සමාගම් පනතක සඳහන් විය යුතු ප්‍රතිපාදන

- ඉඩමේ පෞද්ගලික අයිතිය නොවෙනස් ව පවතිද්දී එහි වටිනාකමට සමාගමේ කොටස් නිකුත් කිරීම,
- සමාගම සතු ගොවිබිම නිශ්චිත භූගෝලීය පිහිටීමකට අයත් වීම හා එම සීමාවේ ඉඩම් හිමියකු නොවන කිසිවකුට සමාගමේ සාමාජිකයකු වීමට නොහැකි වීම,
- ඉඩම විකිණීමකින් හැර අන් අයුරකින් කොටස් විකිණීමට නොහැකි වීම,
- ඉඩමක් සම්පූර්ණයෙන් ම හෝ කොටස් කර හෝ විකිණීම,
- උරුමක්කරුවන්ට ඉඩමේ අයිතිය මාරු වීම,
- සමාගමෙන් ඉවත් වීම
- අඳ ගොවි හිමිකම,
- කළමනාකරණය, ගිණුම් තැබීම හා විගණනය සම්බන්ධ විධිවිධාන හා
- සමාගමේ ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

ඇමුණුම 2 : ගොවි සාමූහිකයක් පිහිටුවා ගැනීමේ ව්‍යවස්ථා මාලාවක කෙටුම්පත

2025 මැයි 12